# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක : **02/2015**

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2015, පෙබරවාරි මස 05 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>විධිමත් විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීම</u>

2006.03.06 දිනැති ආයතන චක්‍රලේඛ ලිපි අංක 06/2006 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2014.09.30 වන දින සිට බලපැවැත්වෙන පරිදි උසස් අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන විධිමත් විනයානුකූල පරීක්ෂණ සඳහා ගෙවීම් කිරීමේදී පහත වගුවෙහි සඳහන් රේටයන් අදාල කර ගන්නා ලෙස 2014.09.30 දිනැති DMS/0008/OUSL ලිපිය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇත.

| විස්තරය | පරීක්ෂණ පැවැත්වෙන පැයකට දීමනාව | ලිපිකරු/ යතුරු ලේඛක සහාය හා තැපැල් ගාස්තු වශයෙන් වැයවූ මුදල් ප්‍රතිපූර්ණය කිරීම | අවසාන වාර්තාව සහ සාක්ෂි සම්පිණ්ඩන වාර්තාව පිළියෙල කිරීම |
|---|---|---|---|
| 01. පරීක්ෂණ නිලධාරී | | | |
| අ). මධ්‍යම කළමනාකරණ මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ නිලධාරියෙකුට විරුද්ධව පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණය | රු. 375/- | රු. 1875/- | රු. 3750/- |
| ආ). මධ්‍යම කළමනාකරණ මට්ටමට පහළ මට්ටමේ නිලධාරියෙකුට විරුද්ධව පැවැත්වෙන විධිමත් විනය පරීක්ෂණය | රු. 300/- | රු. 1500/- | රු. 3750/- |
| 02. පැමිණිල්ල මෙහෙයවන නිලධාරී | රු. 200/- | - | රු. 1250/- |
| 03. පරීක්ෂණයෙහි කටයුතු කරන යතුරු ලේඛකයෙකුට/ ලඝුලේඛකයෙකුට පරීක්ෂණය පැවැත්වෙන පැයකට | රු. 125/- | - | - |

ඉහත සඳහන් දීමනාවලට අමතරව විශ්‍රාමික පරීක්ෂණ නිලධාරියෙකුට ඔහු විශ්‍රාම යන විට රජයේ සේවයේ දැරූ තනතුර පදනම් කරගෙන සහ රාජ්‍ය සේවයේ නියුතු පරීක්ෂණ නිලධාරියෙකුට ඔහු දරණ තනතුර පදනම් කරගෙන ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම ඇත. තවද, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සේවය කරන ලද නිලධාරියෙකුට ඔහු විශ්‍රාම යන විට දැරූ තනතුර පදනම් කරගෙන කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 34 හි විධිවිධානයන්ට අනුකූලව ගමන් වියදම් හා සංයුක්ත දීමනා ලබා ගැනීමට හිමිකම ඇත.

ඉහත වෙනස්වීම හැර ආයතන චක්‍රලේඛ ලිපි අංක 06/2006 හි විධිවිධාන වල කිසිදු වෙනසක් සිදු නොවේ.

කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ/කළේ: මහාචාර්ය ක්‍ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:
1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යෙ.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ජ්‍යෙ.ස.මූ/ස.මූ
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තිය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/2/47